මගේ අංකය - ජේඑස්සී/ඊඒ/ස්ථානමාරු 2026

සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන්,
සිවිල් අභියාචනා මහාධිකරණ විනිශ්චයකාරවරුන්,
දිසා විනිශ්චයකාරවරුන්,
මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් හා අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්,

**<u>උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ ලසු ලේඛක</u>**
**<u>වාර්ෂික ස්ථානමාරු - 2026</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ සමාංක හා 2026.02.10 දිනැති ලිපිය හා බැඳේ.

අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 ඌ (1) (ආ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව සහ 2016.08.15 දිනැති අධිකරණ සේවා කොමිෂන් සභා තීරණය පරිදි සිදු කරන ලද උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ ලසු ලේඛක වාර්ෂික ස්ථානමාරු නියෝග මේ සමග අමුණා ඇති **<u>ඇමුණුම - A</u>** <u>(Annexure -A)</u> හි සඳහන් වේ.

- **<u>උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ ලසු ලේඛක වාර්ෂික ස්ථානමාරු 2026 අප්‍රේල් මස 02 වෙනි දින සිට ක්‍රියාත්මක වේ.</u>**

02. අධිකරණ ලසු ලේඛක තනතුරු ආශ්‍රිතව අධිකරණවල පවතින අවස්ථානුගත තත්ත්වයන්, සේවා අවශ්‍යතාව සහ පුරප්පාඩු කළමනාකරණය කරමින් නිලධාරීන්ගේ ස්ථාන මාරු ඉල්ලීම් ඇතුළු විශේෂිත ඉල්ලීම් සලකා බලමින් නිලධාරීන් විසින් නම් කරන ලද ස්ථාන 05න් එක් ස්ථානයක් ලබාදීමට හැකිතාක් දුරට කටයුතු කර ඇත.

03. දකුණු පළාත තුළ **බලපිටිය, ගාල්ල, මාතර හා තංගල්ල** යන අධිකරණ සංකීර්ණ සහ **දෙයියන්දර හා වලස්මුල්ල** යන අධිකරණ කේන්ද්‍ර කර ගනිමින් ලැබී ඇති ස්ථාන මාරු අයදුම්පත් සංඛ්‍යාව 120 ට අධික වන නමුත් එම අධිකරණ සඳහා අනුප්‍රාප්තික අවශ්‍යතාව ඇතුළුව පිරවිය හැකි උපරිම පුරප්පාඩු සංඛ්‍යාව 11 කි. ඉන් පුරප්පාඩු 02ක් පවතිනුයේ **<u>ඉංග්‍රීසි ලසු ලේඛක</u>** නිලධාරීන් සඳහා වන බව අවධාරණය කරමි.

04. කෙසේ නමුත් ඉහත කී අවස්ථානුගත තත්ත්වයන් මත දකුණු පළාතෙන් බාහිර පළාත් වෙත ස්ථාන මාරු කරන ලද නිලධාරීන්ගේ විශේෂ ඉල්ලීම් අසනීප තත්ත්වයන් හා අනෙකුත් අපහසුතා සැලකිල්ලට ගනිමින් අනුප්‍රාප්තික අවශ්‍යතාව නව බඳවා ගැනීම් මගින් කළමනාකරණය කර ගනිමින් දකුණු පළාත තුළ සේවා අවශ්‍යතාව පවතින ආසන්න අධිකරණ වෙත සහ කළුතර, පානදුර අධිකරණ සංකීර්ණ වෙත ස්ථාන මාරු ලබා දීමට කටයුතු කර ඇත.

05. මීට අමතරව, දකුණු පළාතේ ස්ථිර පදිංචිය ඇතිව දකුණු පළාතෙන් පරිබාහිර සේවා ස්ථානයක හෝ ස්ථානවල වසර 09 ට වැඩි කාලයක් සේවය කල නිලධාරීන්ට හා වසර 09 ට අඩු නමුත් ස්ථාන මාරු සඳහා අවම ඉල්ලුමක් පවතින <u>තිස්සමහාරාමය දිසා/මහේස්ත්‍රාත් අධිකරණය හා උඩුගම දිසා/ මහේස්ත්‍රාත් අධිකරණය</u> වෙත ස්ථාන මාරු අයදුම් කළ නිලධාරීන්ට පමණක් දකුණු පළාත තුළට ස්ථාන මාරු ලබාදීමට මෙවර කටයුතු කර ඇත.

**06. ඒ අනුව දකුණු පළාතෙන් පරිබාහිර සේවා ස්ථානවල සේවය කරන සේවා කාලය වසර 09ට අඩු නිලධාරීන් අධික ඉල්ලුමක් පවතින දකුණු පළාත තුළට ස්ථාන මාරු අභියාචනා ඉදිරිපත් කල ද සලකා බැලීමේ හැකියාවක් නොමැති බව කාරුණිකව දන්වමි.**

07. තව ද අධිකරණ ලසු ලේඛක නිලධාරීන් මුදා හැරීම, ගමන් වියදම් සම්බන්ධයෙන් මගේ සමාංක හා 2026.02.10 දිනැති ලිපියේ 04,05 සහ 06 ඡේද අදාළ කර ගත යුතුය.

08. ඉහත 06 ඡේදයට අදාළ අධිකරණ ලසු ලේඛක නිලධාරීන් සහ අයදුම් කරන ලද ස්ථාන 05න් එකකට හෝ එම අධිකරණය පිහිටි අධිකරණ සංකීරණයේ වෙනත් අධිකරණයකට හෝ ස්ථාන මාරු ලැබී ඇති නිලධාරීන් නැවත අභියාචනා <u>ඉදිරිපත් නොකළ යුතුය</u>.

09. වාර්ෂික ස්ථාන මාරු අභියාචනා එවීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාල නිල වෙබ් අඩවියේ පළ කර ඇති උපදෙස් අනුව අයදුම්පත් Ms Word මඟින් සකසා **2026.03.12** දින පස්වරු 3.00 හෝ එදිනට පෙර ඊමේල් (E-mail) මඟින් ඉදිරිපත් කළ යුතු අතර එහි දෘඩ පිටපත 2026.03.16 දිනට ප්‍රථම ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ ***"වාර්ෂික ස්ථානමාරු අභියාචනා 2026, පිරිස් පාලන අංශය"*** යනුවෙන් සඳහන් කර ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, අලුත්කඩේ, කොළඹ - 12 යන ලිපිනයට එවිය යුතුය. (ඇමුණුම 01 බලන්න.)

ප්‍රසන්න අල්විස්
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2026 මාර්තු මස 06 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දීය.

Specimen Form - A

# Annual Transfer Appeals – 2026

Through High Court Judge,
High Court,
..................................

Secretary,
Judicial Service Commission Secretariat,
Colombo – 12.

Name of the Court : High Court, ..............................
Designation : Court Stenographer

| S/No | 1. Name of the Officer (Mr./Mrs./Miss.)<br>2. Designation (Medium)<br>3. Grade<br>4. Personal file number<br>5. Present Station | 1. Date of Birth<br>2. Age as at 31.12.2025<br>3. Marital status<br>4. Details of children if any | 1. Permanent residential address and /or<br>2. Temporary address | Whether completed 04 years at the Present station (Yes/ No) | Station served and period of service in each station | | Preferred stations | Granted station under annual transfers | Whether granted a requested station (Yes/ No) | Reason(s) for applying including cases and spouse/relations/siblings details served in Courts (In brief) | Recommendation/Not Recommended the transfer with/without a replacement |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | Mr.K.P. Silva<br>(Sinhala)<br>Grade II<br>EA/PF/03/xxxxx<br>HC<br>.......................<br>(Court Name) | 17.10.1985<br>40 Years<br>04 months<br>Married<br>02 children<br>(10 years) | 1.<br><br>2. | Yes | 1. MC Ratnapura<br><br>2. DC/MC Pelmadulla<br>3. HC Homagama | 2014.01.01 - 2017.12.31<br>**04 Years**<br>2018.01.01 - 2021.12.31<br>**04 Years**<br>2022.01.01 – up to date<br>**04 Years** | 1. .............<br>( km)<br>2. .............<br>( km)<br>3. .............<br>( km)<br>4. .............<br>( km)<br>5. .............<br>( km) | ........................ | | 1. Petitioner in the case of MS/5xxxx in DC ...............<br>2. Travelling expenses. (Rs...... /- per month)<br>3. To look after children.<br>4. Spouse, Mrs. H.A.P. Rangika Perera, Clerk, Gr.III serves in DC/MC..... | Recommended/Not Recommended the transfer with /~~without~~ a replacement |

I hereby certify that above particulars are checked and verified.
Establishment Clerk: ..................................................
I hereby certify above particulars are accurate.
Registrar: ........................................

..................................................................
Signature of Head of the Department

1. ඉහත ආකෘතිය - A (Specimen Form - A) අනුව Ms Word මගින් අයදුම්පත් සකසා "Steno – HC ……" (Court Name) ලෙස නම් කර **word document** ලෙස Attach කර පහත දක්වා ඇති විද්‍යුත් ලිපිනය වෙත පමණක් එවිය යුතුය. (මෙහිදී pdf file, scanned photos එවීම නොකළ යුතුය.)

| අනු අංකය | සේවා ගනය | එවිය යුතු විද්‍යුත් ලිපිනය |
|---|---|---|
| 1. | අධිකරණ ලඝු ලේඛක | appeal.steno@jsc.gov.lk |

2. ස්ථාන මාරු අභියාචනා දඬ පිටපත සමඟ 2026 වාර්ෂික ස්ථාන මාරු අභියාචනා ඉදිරිපත් කරන නිලධාරීන්ගේ නම් ලැයිස්තුවක් එවීමට කටයුතු කරන්න.

උදා:- 1. අධිකරණ ලඝු ලේඛක

| අනු අංකය | නිලධාරියාගේ නම | ශ්‍රේණිය | වසර 09/04 සම්පූර්ණ බව (ඔව්/ නැත) |
|---|---|---|---|
| 1. | | I ශ්‍රේණිය | |
| 2. | | II ශ්‍රේණිය | |